සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

62 S I

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය : ........................................ පුරවැසි අධ්‍යාපනය - I කාලය : පැය 03යි.

වැදගත් :

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
- අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
- ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) යොදන්න.

---

(1) වර්තමානයේ ශ්‍රී ලංකාව ඇතුළු ලෝකයේ බොහෝ රටවල දක්නට ඇති පාලන ක්‍රමය වන්නේ,
1. රාජාණ්ඩු ක්‍රමයයි. 2. රදළ ආණ්ඩු ක්‍රමයයි.
3. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයයි. 3. ජනාධිපති ආණ්ඩු ක්‍රමයයි.

(2) ග්‍රීක භාෂාවෙන් Demos හා Kratos යන වචන දෙකේ අදහස වන්නේ කුමක් ද?
1. ජනතාව හා පාලනයයි. 2. ජනතාව හා ප්‍රජා කණ්ඩායම් පාලනයයි.
3. ජනතාව හා පාලන ක්‍රමයයි. 4. ජනතාව හා ප්‍රජාතන්ත්‍රවාදයයි.

(3) ''ඇතැන්ස්'' පෞර රාජ්‍යයේ ප්‍රධානත ම පාලන ආයතනය හැඳින් වූ නම පිළිතුරු අතරින් තෝරන්න.
1. ප්‍රාදේශීය සභා. 2. නගර සභා.
3. පුරවැසි සභා. 4. පලාත් සභා.

(4) ග්‍රීක නාගරික රාජ්‍යවල පුරවැසියන් ලෙස සලකනු ලැබුවේ කුමන පිරිසදැයි පිළිතුරු අතරින් තෝරන්න.
1. වැඩිහිටි පිරිමි සහ වහලුන් ය. 2. වැඩිහිටි පිරිමි සහ විදේශිකයන් ය.
3. වැඩිහිටි පිරිමි සහ කාන්තාවන් ය. 3. වැඩිහිටි පිරිමි සහ රදළයන් ය.

(5) තීන්දු ගැනීමේ ක්‍රියාවලියට සියළු දෙනා ම සම්බන්ධවීම හඳුන්වනු ලබන්නේ,
1. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය නමිනි. 2. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය නමිනි.
3. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය නමිනි. 4. වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය නමිනි.

6) ක්‍රි.ව. 5වන සියවසේ සිට 15වන සියවස දක්වා යුරෝපයේ පැවති සමාජ ක්‍රමය හඳුන්වනු ලැබුවේ,
1. වැඩවසම් සමාජ ක්‍රමයයි. 2. ධනවාදී සමාජ ක්‍රමයයි.
3. වාණිජවාදී සමාජ ක්‍රමයයි. 4. රාජාණ්ඩුවාදී සමාජ ක්‍රමයයි.

(7) ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීමේ ක්‍රියාවලිය යුරෝපයේ ආරම්භ වන්නේ,
1. 1789 ප්‍රංශ විප්ලවයෙන් පසු ය. 2. 1776 ඇමරිකානු විප්ලවයෙන් පසුව ය.
3. 1688 ඉංග්‍රීසි විප්ලවයෙන් පසුව ය. 4. 1917 රුසියානු විප්ලවයෙන් පසුව ය.

(8) ''ජනතාව විසින් ජනතාව උදෙසා පවත්වාගෙන යනු ලබන ජනතාවගේ පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයයි''. යනුවෙන් ප්‍රකාශ කළේ කවු ද?
1. සීලර්. 2. ඇරිස්ටෝටල්. 3. ඒබ්‍රහම් ලින්කන්. 4. මහාචාර්ය ගානර්.

(9) ප්‍රජාතන්ත්‍රවාදී රටක ලක්ෂණයක් පහත පිළිතුරු අතරින් තෝරන්න.
1. ඉතා උසස් ආර්ථික මට්ටමක් පැවතීම. 2. ඒක පක්ෂ ක්‍රමයක් පැවතීම.
3. නිදහස් හා පක්ෂපාති ජනමාධ්‍යයක් පැවතීම. 4. ආණ්ඩු පක්ෂයක් හා විරුද්ධ පක්ෂයක් පැවතීම.

(10) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ඇති රටවල පාලනය සඳහා නියෝජිතයන් තෝරාගනු ලබන්නේ,

1. සෘජු ප්‍රජාතන්ත්‍රවාදය පදනම් කරගෙන ය. 2. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය පදනම් කරගෙන ය.
3. සර්වජන ඡන්ද බලය පදනම් කරගෙන ය. 4. ජනමත විචාරණය පදනම් කරගෙන ය.

(11) ශ්‍රී ලංකාවේ ජනතා පරමාධිපත්‍ය බලයට අයත්වන අයිතම තුන පිළිතුරු අතරින් තෝරන්න.

1. ඡන්ද බලය, මූලික අයිතීන්, මූලික යුතුකම්. 2. ඡන්ද බලය, මූලික අයිතීන්, නිදහස.
3. ඡන්ද බලය, මූලික අයිතීන්, පාලන බලය. 4. ඡන්ද බලය, මූලික යුතුකම්, නිදහස.

(12) රටක පාලනය සඳහා සකස් කරනු ලැබූ ප්‍රතිපත්ති මාලාවක් පදනම් කරගෙන පාලන බලය ලබා ගැනීමේ අරමුණු ඇතිව සංවිධානය වූ පුද්ගල කණ්ඩායම සරළව හඳුන්වනු ලබන්නේ,

1. මහජන මතය ලෙස ය. 2. බලපෑම් කණ්ඩායම් ලෙස ය.
3. සිවිල් සංවිධාන ලෙස ය. 4. දේශපාලන පක්ෂයක් ලෙස ය.

(13) ඒක පක්ෂ ක්‍රමයක් පදනම් කරගෙන පාලනය ක්‍රියාත්මක වන රටවලට උදාහරණ පහත පිළිතුරු අතරින් තෝරන්න.

1. ඉන්දියාව, ශ්‍රී ලංකාව, ඇමරිකාව. 2. චීනය, උතුරු කොරියාව, කියුබාව.
3. චීනය, උතුරු කොරියාව, ඉන්දියාව. 4. චීනය, උතුරු කොරියාව, ශ්‍රී ලංකාව.

14) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හඳුන්වාදුන් සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් වන්නේ කුමක්දැයි පිළිතුරු අතරින් තෝරන්න.

1. ජනමත විචාරණය. 2. ප්‍රාරම්භනය. 3. පුනරාවර්ථනය. 4. ප්ලේබිසයිඩ් ක්‍රමය.

(15) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුට ඡන්ද බලය හිමිකරදීමේ දී සැලකිල්ලට ගනු ලබන නිර්ණායකයන් පහත පිළිතුරු අතරින් තෝරන්න.

1. ස්ත්‍රී / පුරුෂ භාවය 2. රැකියාව හා ආදායම් මට්ටම.
3. ජන වර්ගය. 4. නියම කරන ලද වයස් සීමාව.

(16) පහත 'අ' තීරුවේ සඳහන් ලක්ෂණවලට ගැලපෙන ලක්ෂණ 'ආ' තීරුව සමග නිවැරදිව පිළිවෙලින් ගලපා ඇති පිළිතුර තෝරන්න.

| | 'අ' | | 'ආ' |
|---|---|---|---|
| 1 | නීතියේ ආධිපත්‍ය | A | රටේ යහපාලනය ගොඩනැගීම. |
| | | B | චෝදනා පත්‍රයකට අනුව පමණක් පුද්ගලයකු අත් අඩංගුවට ගැනීම. |
| 2 | ජනතාවගේ ජීවන තත්වයේ ගුණාත්මක සංවර්ධනය ඇති කිරීම. | C | රටේ සම්පත් බෙදීයාමේ විෂමතාව වර්ධනය කිරීම. |
| 3 | සාමකාමී පරිසරයක් ගොඩනැගීම. | D | ආහාර, නිවාස, අධ්‍යාපනය වැනි පොදු පහසුකම් වර්ධනය කිරීම. |
| | | E | නීතියේ ආධිපත්‍ය පැවතීම. |

1. AEC 2. BDE 3. ADE 4. CDE

(17) ශ්‍රී ලංකාව මැතිවරණ දිස්ත්‍රික්ක කොපමණ සංඛ්‍යාවකට බෙදා ඇත්තේදැයි පිළිතුරු අතරින් තෝරන්න.

1. 21 2. 22 3. 25 4. 26

(18) ප්‍රජාතන්ත්‍රවාදී රටක ඡන්ද දායකයෙකු සතු යුතුකමක් වන්නේ කුමක්දැයි පිළිතුරු අතරින් තෝරන්න.

1. ඡන්දය පාවිච්චි කිරීම. 2. මැතිවරණ ප්‍රචාරක රැස්වීම්වලට සහභාගි වීම.
3. මැතිවරණ ප්‍රචාරක රැස්වීම් ඇමතීම. 4. මැතිවරණ නීති රීති උල්ලංඝනය නොකිරීම.

(19) මිනිසකුට තම සමාජ ජීවිතය පරිපූර්ණ කර ගැනීම සඳහා සමාජයෙන් ලැබෙන හිමිකම හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

1. නිදහස ලෙස ය. 2. අයිතිවාසිකම් ලෙස ය.
3. සමානාත්මතාවය ලෙස ය. 4. මූලික අයිතිවාසිකම් ලෙස ය.

(20) මානව අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් ඉතිහාසය තුළ වැදගත් ම අවස්ථාව ලෙස සැලකෙන්නේ කවරක්දැයි පිළිතුරු අතරින් තෝරන්න.

1. ක්‍රි.ව. 1948 දෙසැම්බර් මස 10වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරන ලද මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයයි.
2. ක්‍රි.ව. 1945 දෙසැම්බර් මස එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරන ලද මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයයි.
3. ක්‍රි.ව. 1215 බ්‍රිතාන්‍ය මැග්නා කාර්ටා ගිවිසුමයි.
4. ක්‍රි.ව. 1689 එංගලන්තය විසින් සම්මත කරන ලද අයිතිවාසිකම් පනතයි.

- **පහත ප්‍රකාශ කියවා සදාචාරාත්මක යුතුකම් ඇතුළත් පිළිතුර තෝරන්න.**

A රජයට නියමිත බදු ගෙවීම.
B පවතින නීතියට ගරු කිරීම.
C ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම.
D වැඩිහිටියන්ට ගරු කිරීම.
E සමාජ සිරිත් විරිත් පිළිපැදීම.

(21) 1. A හා B 2. B හා C 3. C හා D 4. D හා E

(22) ප්‍රජාතන්ත්‍රවාදී රටක අධිකරණයට අයත්වන ප්‍රධානතම කාර්යය වන්නේ,

1. නීති සම්පාදන කාර්යයි.
2. යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමයයි.
3. නීති ක්‍රියාවට නැගීමයි.
4. පහළ අධිකරණවලට අවශ්‍ය උපදෙස් ලබා දීමයි.

(23) රටක අධිකරණයේ ස්වාධීනත්වය පැවතීම තුළින් පුරවැසියන්ට අත්වන ප්‍රතිලාභ පිළිතුරු අතරින් තෝරන්න.

1. පුරවැසියන්ට යුක්තිය හා සාධාරණත්වය සමානව ඉටු වීම.
2. සත්‍ය හා නිවැරදි තොරතුරු ජනතාවට ලැබීම.
3. පාලනයේ ක්‍රමවත්බව හා ස්ථාවරබව ඇති වීම.
4. ජනතාවගේ ගැටළු පාලක පක්ෂය වෙත ඉදිරිපත් කිරීම.

(24) රටක සියල්ලට ම ඉහළින් නීතිය පැවතීම හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

1. නීතියේ සමානතාවය ලෙස ය.
2. නීතියේ යුක්තිය ලෙස ය.
3. නීතියේ ආධිපත්‍ය ලෙස ය.
4. නීති පැළිපැදීම ලෙස ය.

(25) රාජ්‍ය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ චින්තකයන් දෙදෙනෙක් පහත පිළිතුරුවලින් තෝරන්න.

1. මහාචාර්ය ගානර් සහ ඒබ්‍රහම් ලින්කන්.
2. සීලර් සහ ඒබ්‍රහම් ලින්කන්.
3. මහාචාර්ය ගානර් සහ ඇරිස්ටෝටල්.
4. ඇරිස්ටෝටල් සහ සීලර්.

(26) ''එක් ජාතියක් එක් රාජ්‍යයක්'' යන සංකල්පය මත යුරෝපයේ නිර්මාණය වූ රාජ්‍ය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

1. වැඩවසම් රාජ්‍ය. 2. පෞර රාජ්‍ය. 3. නූතන ජාතික රාජ්‍ය. 4. පෙරදිග රාජ්‍ය.

- **පහත වගන්ති කියවා 27 හා 28 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.**

A පුනරුදය.
B විද්‍යා දැනුම වර්ධනය.
C ජාතික ඒකාග්‍රතාව.
D යුධ හා නාවික ශක්තිය.
E ස්වාධිපති බලය.

(27) ජාතික රාජ්‍ය බිහිවීමට තුඩුදුන් හේතු ඇතුළත් පිළිතුරු තෝරන්න.

1. A හා B 2. B හා C 3. C හා D 4. C හා E

(28) සමහර රටවල් ප්‍රබල ජාතික රාජ්‍ය ලෙස නැගී සිටීමට හේතු ඇතුළත් පිළිතුර තෝරන්න.

1. A හා B 2. B හා C 3. C හා D 4. C හා E

(29) තල දෙකක ආණ්ඩු ක්‍රියාත්මක වීම, කුමන ආණ්ඩුක්‍රමයක ලක්ෂණයක්දැයි පිළිරු අතරින් තෝරන්න.

1. සහ සන්ධීය ආණ්ඩුක්‍රම
2. ඒකීය ආණ්ඩුක්‍රම.
3. අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රම.
4. සන්ධීය ආණ්ඩුක්‍රම.

(30) කිසියම් රාජ්‍යයක කැමැත්ත හා මහජන පොදු අපේක්ෂා ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නන්වන නියෝජිතයා වන්නේ,

1. රාජ්‍යයයි. 2. මහජනතාවයි. 3. ආණ්ඩු පක්ෂයයි. 4. ආණ්ඩුවයි.

(31) ව්‍යවස්ථාදායකය විසින්, සෘජුව ම විධායකය පාලනය කිරීමක් සිදු **නොවන්නේ** කුමන ආණ්ඩුක්‍රමයකදැයි පිළිතුරු අතරින් තෝරන්න.

1. ජනාධිපති ආණ්ඩුක්‍රමය. 2. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය.
3. සන්ධීය ආණ්ඩුක්‍රමය. 4. ඒකීය ආණ්ඩුක්‍රමය.

(32) ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාගේ ප්‍රධාන කාර්යය වන්නේ,

1. නීති ක්‍රියාවට නැගීමේ කාර්යයයි. 2. නීති සම්පාදන ක්‍රියාවලියයි.
3. යුක්තිය පසිඳලීමේ කාර්යභාරයයි. 4. විධායකය පාලනය කිරීමේ කාර්යභාරයයි.

(33) සෙසු අයගේ අයිතිවාසිකම් හා නිදහසට ගරු කිරීම අයත් වන්නේ,

1. පුරවැසියා සතු යුතුකම්වලට ය. 2. පුරවැසියා සතු අයිතිවාසිකම්වලට ය.
3. රාජ්‍ය සතු අයිතිවාසිකම්වලට ය. 4. රාජ්‍ය සතු යුතුකම්වලට ය.

(34) රටක යහපාලනය ගොඩනැගීම සඳහා දායකත්වය ලබාදෙන ඡන්දදායකයකුගේ තිබිය යුතු ලක්ෂණ පහත පිළිතුරු අතරින් තෝරන්න.

1. තමන් කැමති පක්ෂයක කැමති නියෝජිතයෙක් තෝරා ගැනීම.
2. වැරදි ක්‍රියාවල නිරතවන දේශපාලකයන් මැතිවරණයක දී නැවත බලයට පැමිණීම වැලැක්වීම.
3. රටට ආදරය කරන ඉතා ජනප්‍රිය පුද්ගලයෙකු පත් කර ගැනීම.
4. දේශපාලනය කරන පරම්පරාවට අයිති පුද්ගලයෙකු පත් කර ගැනීම.

(35) නීතියේ ආධිපත්‍ය පවතින රටක දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

1. නීතියේ රැකවරණය බලයේ සිටිනවුන්ට වැඩිපුර ලැබීම.
2. පුරවැසියන් තුළ රජය කෙරෙහි පවතින විශ්වාසය අඩු වීම.
3. අධිකරණයට බලපෑම් එල්ල වීම.
4. නීතියේ රැකවරණය සැමට සමානව ලැබීම.

(36) ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මක් ගත කරන පුරවැසියෙකු තුළ **නොතිබිය** යුතු ගුණාංගයක් වන්නේ කුමක්දැයි පිළිතුරු අතරින් තෝරන්න.

1. සාකච්ඡා මගින් තීරණවලට එළඹීම. 2. විරුද්ධ මත ඉවසීම.
3. සහයෝගයෙන් කටයුතු කිරීම. 4. බහුතර මතයට ගරු කිරීම හා සුළුතරය මර්ධනය කිරීම.

(37) රටක මූලික මිනිස් අවශ්‍යතා ලෙස සලකනු ලබන්නේ කුමක්දැයි පිළිතුරු අතරින් තෝරන්න.

1. ආහාර, ඇඳුම්, නිවාස. 2. ආහාර, ඇඳුම්, යටිතල පහසුකම්.
3. ආහාර, නිවාස, යටිතල පහසුකම්. 4. ආහාර, නිවාස, ගමනාගමන කටයුතු.

(38) ප්‍රජාතන්ත්‍රවාදී රටක පුරවැසියෙකුට පාලනයට සහභාගි වීමට ලැබෙන අවස්ථාවක් වන්නේ,

1. ආණ්ඩුව විවේචනය කිරීම.
2. මැතිවරණයක දී ඡන්ද අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීම.
3. ජනමාධ්‍ය හරහා සිය මතය ප්‍රකාශ කිරීම.
4. ආණ්ඩුවට විරුද්ධව උද්ඝෝෂණවලට සහභාගි වීම.

(39) ප්‍රජාතන්ත්‍රවාදී රටක අධිකරණයේ ස්වාධීනත්වය ලෙස විග්‍රහ කරනු ලබන්නේ කුමක්දැයි පිළිතුරු අතරින් තෝරන්න.

1. අධිකරණයට අවශ්‍ය ආකාරයට කටයුතු කිරීමට ඇති හැකියාවයි.
2. අධිකරණයට කිසිදු බලපෑමකින් තොරව ක්‍රියාත්මක වීමට ඇති ඉඩ කඩයි.
3. විධායකයට හැර අනිකුත් කිසිදු ආයතනයක බලපෑමෙන් තොරවීමයි.
4. අධිකරණය ව්‍යවස්ථාදායකයේ නීතියට අවනතව කටයුතු කළ යුතු වීමයි.

(40) ශ්‍රී ලංකාවේ උතුරු මැද පලාතට අයත්වන මැතිවරණ දිස්ත්‍රික්ක දෙක පිළිතුරු අතරින් තෝරන්න.

1. යාපනය, හා වන්නියයි. 2. පොළොන්නරුව හා ත්‍රිකුණාමලයයි.
3. අනුරාධපුරය හා පොළොන්නරුවයි. 4. අනුරාධපුරය හා මාතලේ ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

62 S II

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය : .......................................... පුරවැසි අධ්‍යාපනය - II

වැදගත් :

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

---

01. (i) ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයෙකුට ඡන්දය ප්‍රකාශ කිරීමට ලැබෙන මැතිවරණ දෙකක් නම් කරන්න.
(ii) ශ්‍රී ලංකාවේ වර්තමානයේ දී දක්නට ලැබෙන පක්ෂ දෙකක් නම් කරන්න.
(iii) රට ඡන්ද කොට්ඨාසවලට බෙදීමේ දී යොදා ගන්නා නිර්ණායක දෙකක් ලියන්න.
(iv) සප්ත අපරිහානීය ධර්ම දෙකක් ලියන්න.
(v) ඡන්ද කොට්ඨාස අනුව නියෝජිතයන් තෝරා ගැනීම නිසා අත්වන ප්‍රයෝජන දෙකක් ලියන්න.
(vi) යුතුකම් බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
(vii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාදේශීය පාලන ආයතන අතර බලය බෙදා ඇති ආකාරය අනුව බෙදෙන ආණ්ඩුක්‍රම වර්ග දෙක නම් කරන්න.
(viii) ආණ්ඩුක්‍රමවල ස්වරූපය අනුව බෙදෙන ආණ්ඩුක්‍රම වර්ග දෙක ලියන්න.
(ix) නිදහස් හා සාධාරණ මැතිවරණයක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.
(x) ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු සතුවිය යුතු වැදගත් ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 02 × 10 = 20)

''මහජනයා වෙනුවෙන් තෝරා ගන්නා නියෝජිතයන් මගින් රටේ පාලනය ක්‍රියාත්මක කිරීම වක්‍ර හෙවත් නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ලෙස හඳුන්වයි.''

02. (i) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන ලෝකයේ රටවල් 2ක් නම් කරන්න. (ලකුණු 02)
(ii) පාලන ක්‍රමයක් ලෙස ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටළු තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වැදගත්වන අයුරු පිළිබඳව කරුණු තුනක් ලියා එකක් විස්තර කරන්න. (ලකුණු 05)

''දේශපාලන පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක ක්‍රියාකාරීත්වය සඳහා අත්‍යාවශ්‍ය අංගයකි.''

03. (i) එක් එක් පක්ෂවලින් නියෝජිතයන් තෝරා ගැනීම සඳහා වර්තමාන රාජ්‍යවල බහුලව යොදා ගන්නා නියෝජන ක්‍රම දෙක නම් කරන්න. (ලකුණු 02)
(ii) ලෝකයේ දක්නට ඇති පක්ෂවල ස්වරූප තුන ලියන්න. (ලකුණු 03)
(iii) තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ තුනක් ලියා එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

''ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සඳහා ජනතා නියෝජිතයන් සම්බන්ධ කර ගැනීමට යොදා ගන්නා උපාය මාර්ගයක් ලෙස රට ඡන්ද කොට්ඨාසවලට බෙදා වෙන්කර ඇත.''

04. (i) ඔබේ පළාතට අයත් ඡන්ද කොට්ඨාස දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ඇතුළත් විය යුතු කරුණු තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම නිසා අත්වන ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 05)

''වර්තමාන රාජ්‍ය ජාතික රාජ්‍ය ලෙස සැලකෙන අතර ජාතික රාජ්‍ය යුරෝපයේ ස්ථාපිත වන්නේ 15වන සියවසෙන් පසුව ය.''

05. (i) ජාතික රාජ්‍ය පිළිබඳ සංකල්පය ශක්තිමත් කිරීම සඳහා අදහස් ඉදිරිපත් කළ චින්තකයින් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(ii) ජාතික රාජ්‍යවල ප්‍රධාන ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) රාජ්‍යයක ප්‍රධාන අංග තුනක් ලියා එකක් විස්තර කරන්න. (ලකුණු 05)

''ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් යටතේ මැතිවරණ මගින් ජනතාවගේ බහුතර කැමැත්ත මත ආණ්ඩුවක් තෝරා පත්කර ගනු ලැබේ.''

06. (i) ''රාජ්‍යයේ හෝ ජනතාවගේ කැමැත්ත ප්‍රතිපත්තිවලට හැරවීමත් ඒවා ක්‍රියාවට නැංවීමත් කරනු ලබන නියෝජිතයා ආණ්ඩුව වේ''. මෙසේ ප්‍රකාශ කළේ කවු ද? (ලකුණු 02)

(ii) ආණ්ඩුවක ප්‍රධාන කොටස් තුන ලියන්න. (ලකුණු 03)

(iii) රාජ්‍යයක් විසින් ජන සමාජයට ඉටුකළ යුතු වගකීම් තුනක් ලියා එකක් විස්තර කරන්න. (ලකුණු 05)

''පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ලෝකයට දායාද වන්නේ බ්‍රිතාන්‍ය පාලන ක්‍රමය හරහා ය.''

07. (i) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක විධායකය ප්‍රධාන කොටස් දෙකකට බෙදෙයි. ඒවා නම් කරන්න. (ලකුණු 02)

(ii) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ජනාධිපති ආණ්ඩුක්‍රමයක ලක්ෂණ තුනක් ලියා එකක් විස්තර කරන්න. (ලකුණු 05)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

Provincial Department of Education

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 10 - 2020

## පුරවැසි අධ්‍යාපනය - පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 3 | 21. | 4 | 31. | 1 |
| 02. | 1 | 12. | 4 | 22. | 2 | 32. | 1 |
| 03. | 3 | 13. | 2 | 23. | 1 | 33. | 1 |
| 04. | 4 | 14. | 1 | 24. | 3 | 34. | 2 |
| 05. | 2 | 15. | 4 | 25. | 3 | 35. | 4 |
| 06. | 1 | 16. | 2 | 26. | 3 | 36. | 4 |
| 07. | 3 | 17. | 2 | 27. | 1 | 37. | 1 |
| 08. | 3 | 18. | 4 | 28. | 3 | 38. | 2 |
| 09. | 4 | 19. | 2 | 29. | 4 | 39. | 2 |
| 10. | 3 | 20. | 1 | 30. | 4 | 40. | 3 |

## II කොටස

(01) (i)
- ජනාධිපතිවරණය
- මහාමැතිවරණය
- පළාත් සභා මැතිවරණය
- පළාත් පාලන මැතිවරණය

(ii)
- එක්සත් ජාතික පක්ෂය
- ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
- ජනතා විමුක්ති පෙරමුණ
- ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
- දෙමළ ජාතික සන්ධානය
- ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය
- කඳුරට ජනතා පෙරමුණ ආදි වශයෙන්.

(iii)
- භූමිය
- ජනගහනය

(iv)
- නිතර රැස්වීම හා සාකච්ඡා කිරීම.
- සමගිව රැස්වීම, සමගිව සාකච්ඡා කිරීම, සමඟිව විසිර යාම.
- නොපැන වූ නීති නොපැනවීම, පැන වූ නීති නොපිරිහෙලා ක්‍රියාත්මක කිරීම, ඒවා පිළිපැදීම.

(v)
- ජන සමාජයක පවත්නා ජන වර්ගය, භාෂාව, කුලය වැනි භේද නොසලකා සියල්ලන්ගේ මතය නියෝජනය වන පරිදි නියෝජිතයන් තෝරා පත් කර ගැනීමට අවස්ථාව ලැබීම.
- දේශපාලන ක්‍රියාවලිය පවත්වාගෙන යාමට අවශ්‍ය වන නායකයන් ප්‍රාදේශිය මට්ටමෙන් බිහි කර ගැනීමට අවස්ථාව ලැබීම.
- ඡන්ද කොට්ඨාසයට වගකියන නියෝජිතයෙකු තෝරා පත්කර ගැනීමට ජනතාවට අවස්ථාව ලැබීම.
- ප්‍රාදේශීය සංවර්ධනයට ඉඩ ප්‍රස්තා සැලසීම.

(vi)
- නීතිමය යුතුකම්
- සදාචාරාත්මක යුතුකම්

(vii)
- ඒකීය / සන්ධීය

(viii)
- කැබිනට් / ජනාධිපති

(ix)
- නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්වීම.
- නියමිත සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ට ඡන්ද දායකත්වය / අපේක්ෂකත්වය ලැබීම
- නිදහසේ මැතිවරණ කටයුතුවලට සහභාගී වීමට ඇති අයිතිය තහවුරු වීම.
- මැතිවරණ නීති රීතිවලට අනුකූලව මැතිවරණ පැවැත්වීම.
- සාමකාමී වාතාවරණයන් තුළ මැතිවරණ පැවැත්වීම.

(x) ● සාකච්ඡා මගින් තීරණවලට එළඹීම.
● විරුද්ධ මත ඉවසීම.
● බහුතර මතයට ගරු කිරීම.
● සහයෝගයෙන් කටයුතු කිරීම.
● නීති ගරුකවීම ආදි වශයෙන්. (පි. 29)

02. (i) පිළිතුරට අනුව
(ii) ● වර්තමාන රාජ්‍ය භූමි ප්‍රමාණයන් විශාල වීම.
● වර්තමාන රාජ්‍ය අධික ජනගහනයෙන් සමන්විත වීම.
● සියලු පුරවැසියන් එක් ස්ථානයකට රැස් කිරීමේ අපහසුව.
● සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම.
(iii) ● එය මහජන කැමැත්ත මත සිදුවන නිසා ය.
● පාලනය සඳහා නියෝජිතයන් තෝරා ගනු ලබන්නේ මහජනතාවගේ බහුතර කැමැත්ත අනුව ය.
● ආණ්ඩු බලය හිමිවන්නේ ජනතා ඡන්දයෙන් වැඩි නියෝජිත පිරිසක් තේරී පත් වූ පක්ෂයට හෝ කණ්ඩායමටයි.
● නීති සම්පාදනය කරන්නේ මහජන ඡන්දයෙන් පත් වූ නියෝජිතයන්ගේ බහුතර කැමැත්ත අනුව ය.

03. (i) ● සරල බහුතර නියෝජන ක්‍රමය හා සමානුපාතික නියෝජන ක්‍රමය.
(ii) ● ඒක පක්ෂ ක්‍රමය
● බහු පක්ෂ ක්‍රමය
● ද්වි පක්ෂ ක්‍රමය
(iii) ● ජන මතය නියෝජනයට ඇති ඉඩකඩ පුළුල් වීම.
● අත්තනෝමතික පාලනයක් බිහි වීම වැළැක්වීම.
● ආණ්ඩු පක්ෂයේ අහිතකර ප්‍රතිපත්ති විවේචනය කිරීම තුළින් ඒවා නිවැරදි කර ගැනීමට අවස්ථාව සැලසීම.
● ජන සමාජයේ පවතින විවිධත්වය නිරූපණය වීමට අවස්ථාව සැලසීම.
● බහුවිධතාවය තුළින් එක්සත්බව ගොඩනැගීම.

04. (i) ● කුරුණෑගල / පුත්තලම
(ii) ● ආණ්ඩුවේ ප්‍රධාන ආයතන වන ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය නිර්මාණය වන ආකාරය
● එම ආයතනවල කාර්යභාරය, බලතල හා එම ආයතන අතර පවත්නා සබඳතාවයන්හි ස්වරූපය.
● ආණ්ඩුව හා පුරවැසියා අතර පැවතිය යුතු සම්බන්ධතාවයන්හි ස්රූපය.
● පුරවැසියන් සතු මූලික අයිතිවාසිකම්.
● ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. සම්බන්ධයෙන් වන විධිවිධාන.
(iii) ● පාලනයේ ක්‍රමවත්බව හා ස්ථාවර බව ආරක්ෂා වීම.
● පුරවැසි අයිතිවාසිකම් පිළිබඳව පාලක / පාලිත දෙපක්ෂය දැනුවත් වීම.
● පාලකයන් අත්තනෝමතික ලෙස ක්‍රියා කළහොත් එය වළක්වා ගත හැකි වීම.
● අධිකරණයේ ස්වාධීනත්වය සුරක්ෂිත වීම.
● මූලික අයිතිවාසිකම් සුරක්ෂිත වීම.
● නීතියේ රැකවරණය සැමට සමානව ලැබීම.
● ආණ්ඩුක්‍රමයට සම්බන්ධ ආයතනවලින් රට වැසියන්ට සිය අවශ්‍යතා සිතුම් පැතුම් ඉටු කර ගත හැකි වීම.

05. (i) ● නිකලොයි මැකියාවලී, ජීන් බොඩෑන්, තෝමස් හොබ්ස්
(ii) ● එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන සංකල්පය මත පදනම් වීම.
● භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපති බලය යන අංගයන්ගෙන් සමන්විත වීම.
● වෘත්තීය නිලබල පැලැන්තියක් මගින් පාලන බලය මෙහෙයවීම.
● අභ්‍යන්තර හා බාහිර කටයුතු සම්බන්ධයෙන් ස්වාධිපති බලය හිමි වීම.
(iii) ● භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍යය

06. (i) ● මහාචාර්ය ගානර්
(ii) ● ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය
(iii) ● නීතිය හා සාමය ආරක්ෂා කිරීම.
● සමානාත්මතා මූලධර්මය ආරක්ෂා කිරීම
● ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම.
● නීතියේ සාධාරණත්වය සුරක්ෂිත කිරීම. (පි. 25)

07. (i) ● නාමික විධායකය
● දේශපාලන විධායකය / සත්‍ය විධායකය
(ii) ● මෙය නාමික විධායකය හා සත්‍ය විධායකය යන අංග දෙකකින් සමන්විත වේ.
● ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත් වීම.
● ව්‍යවස්ථාදායකය හා විධායකය අතර ඍජු සම්බන්ධයක් පවතී.
● විධායකය සිය කටයුතු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට සාමූහිකව බැඳී සිටීම.
● විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාව තිබේ.
(iii) ● විධායකය හසුරුවනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි.
● රාජ්‍ය නායකයා මෙන් ම ආණ්ඩුවේ නායකයා ද වන්නේ ජනාධිපතිවරයා ය.
● විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී නැත.
● ව්‍යවස්ථාදායකය මගින් ඍජුව විධායකය පාලනය කිරීමක් සිදු නොවේ.